බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.

மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.

**Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and Information Technology - Western Province**

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

2 வது மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம், 204, டென்ஸில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை

2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My Ref. } 5/3/4- 2023

ඔබේ අංකය / உனது இலக்கம் / Your Ref. }

දිනය / திகதி / Date } 2023.03.

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

.......................................

<u>විශ්වාභිනන්දන කලාකරු සම්මාන වැඩසටහන - 2022- 2023</u>

බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින්, ස්වකීය ප්‍රතිභා ප්‍රභාව තුළින් ශිල්ප කලාවේ නිම් වලලු පුළුල් කොට යුවහසක් ජනී ජනයා නිහඬව සන්තර්පනය කරන ලද නමුදු ඒ සඳහා ජාතික මට්ටමේ ඇගයීමකට පාත්‍ර නොවූ බස්නාහිර පළාත් ගම් දනව් සිසාරා විසිරී සිටින කුසලතා පූර්ණ කලාකරුවන් දිරිගන්වනු වස් ඔවුහු රාජ්‍ය මට්ටමේ ඇගයීමට ලක් කිරීමේ අරමුණින් "විශ්වාභිනන්දන කලාකරු සම්මාන වැඩසටහන - 2023" මෙම වර්ෂයේද පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02.මේ සඳහා ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මඟින් 2022 වර්ෂයේ සම්මාන පිරිනැමීම සඳහා සුදුසු පහත නම් සඳහන් කර ඇති කලාකරුවන්ගේ අයදුම්පත්‍ර අප වෙත ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01හි සඳහන්) එකී අයදුම්පත්‍ර මෙම වර්ෂය සඳහා යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය වේ.

03. ඔබ විසින් දැනටමත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති කලාකරුවන් පිළිබඳව (මරණයට පත්වීම, රට අතහැර යාම) ආදී යම් සංශෝධනයන් තිබේනම් එම සංශෝධනයන් වහාම අප වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටිමි. තවද අයදුම්පත්‍ර යොමු කිරීමට නොහැකි වූ කලාකරුවන්ගේ තොරතුරු පහත සඳහන් කලා ක්ෂේත්‍ර යටතේ ඉදිරිපත් කළ හැකිය.

01.) සංගීත (අධ්‍යක්ෂණය/ තනු නිර්මාණය), ගායනය හා වාදනය

02.) නර්තනය හා බෙර වාදනය

03.) චිත්‍ර, මූර්ති, කැටයම්, ගොක් කලා හා වෙස් මුහුණු

04.) ශාන්ති කර්ම, බලි තොවිල් හා අංගම්පොර

05.) හිටිවන කවි හා බයිලා කලාව



| | කාර්යාලය அலுவலகம் Office | ලේකම් செயலாளர் Secretary | ගිණුම් கணக்குகள் Accounts | සැලසුම් திட்டமிடல் Planning | ක්‍රීඩා விளையாட்டு Sports | සංස්කෘතික கலாசாரம் Cultural |
|---|---|---|---|---|---|---|
| දුරකතන/ தொலைபேசி /Phone | 0112 092883<br>0112 093075 | 0112 092873 | 0112 093088<br>0112 093068 | 0112 092869<br>0112 093135 | 0112 092887<br>0112 093097 | 0112 092875<br>0112 093105 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 0112 092874 | 0112 092874 | 0112 092880 | 0112 092874 | 0112 092888 | 0112 092874 |
| ඊ මේල් / E-mail / | moe.wp.gov@gmail.com | | වෙබ් ලිපිනය/இணையதளம்/WebSite | | www.moe.wp.gov.lk | |

06.) වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය හා සිනමාව (රංගනය, අධ්‍යක්ෂණය, රංග වින්‍යාසය, පිටපත් රචනය, සංස්කරණය, කැමරාකරණය, ආලෝකකරණය ආදිය)

07.) සාහිත්‍ය ලේඛන කලාව, ගී පද රචනය හා ජන මාධ්‍ය

08.) ඡායාරූපකරණය

09.) නිවේදනය හා හඬ කැවීම

10.) වේදිකා පසුතල නිර්මාණ, ඇඳුම් රංග වස්ත්‍ර හා මෝස්තර නිර්මාණ

11.) සුවිශේෂී කලා ක්ෂේත්‍ර (රූකඩ කලාව, මැජික් කලාව, බතික් කලාව, මංගල පෝරු චාරිත්‍ර ,ඩිජිටල් ආදී නව තාක්ෂණ කලාවන් වැනි )

04. ඒ අනුව මේ සමඟ අමුණා ඇති අයදුම්පත් මගින් එක් එක් කලා ක්ෂේත්‍රයන්ගෙන් නාම යෝජනා ඔබ කොට්ඨාශයෙන් උපරිමය 05 කට යටත්ව **2023 මාර්තු 31** දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව මෙම අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

05.ඉහත සියලුම ක්ෂේත්‍රයන් යටතේ එක් එක් කලා ශිල්පියා අදාළ ක්ෂේත්‍රයන්ගේ සිදු කරන ලද කාර්ය භාරය තහවුරු කිරීමට ඉදිරිපත් කළ හැකි තොරතුරු හා මුලාශ්‍ර බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී විසින් සහතික කර අප වෙත එවිය යුතුය.
(සහතික,ග්‍රන්ථ,ඡායාරූප,යනාදිය)

06.තවද එම නාම යෝජනා අප වෙත යොමු කිරීමේ දී පහත සඳහන් නිර්ණායකද සැලකිල්ලට ගන්නා මෙන් වැඩි දුරටත් දන්වමි.

- ❖ සෑම අයදුම් කරුවෙකුම මේ වන විට බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
- ❖ මීට පෙර වර්ෂ වලදී බස්නාහිර පළාත් විශ්වාභිනන්දන සම්මානයෙන් පිදුම් නොලද අයෙකු විය යුතුයි.
- ❖ විනිශ්චය මණ්ඩලය විසින් විශ්වාභිනන්දන සම්මානය පිරිනැමීමට සුදුසු කලාකරුවෙකු වශයෙන් තෝරාගත හොත් මුද්‍රණය කිරීමට අපේක්ෂිත සමරු කලාපයට ඇතුළත් කිරීම සඳහා කලාකරුවා පිළිබඳ විස්තරයක් A4 පිටු ½ක සඳහන් කර අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.
- ❖ එක් කලාකරුවෙකු ක්ෂේත්‍ර කිහිපයක් සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන්නේ නම් එක් එක් ක්ෂේත්‍රයන්ට වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

...............................

සිරිසෝම ලොකුවිතාන,

ලේකම්,

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප.)